
හොඳ
යාලුවෝ
යුවිනි සෙනීෂා විජේවර්ධන

# හොඳ යාලුවෝ

## යුවිනි සෙනීෂා විජේවර්ධන

### කතෘ

කතෘගේ වෙනත් කෘති

- අකීකරුකමට පාඩමක්
- තාරා පැටියා

මහ/මහාමායා බාලිකා විදුහල
4 ශ්‍රේණිය A
2025-02-08
ISBN 37253

# පිදුම

*පාට හීන අකුරු කරන්න*

*දිරිය දූන්*

*ආදරණීය*

*අම්මටත්, අප්පච්චිටත්*

*නිතරම මා ළඟම දැවටෙන මල්ලියාටත්...*

*සෙනෙහසින් .....*

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.


එකමත් එක කාලේක පුංචි හා පැංචෙකුයි,


කූඹි පැංචෙකුයි හිටියා.

මෙයාලා හොඳ යාලුවෝ,

දවසක් එයාලා සෙල්ලම් කරද්දි

පඳුරු අස්සෙන් අමුතු සද්දයක් ඇහුණා.







මේ දෙන්නා හිමින් හිමින් පඳුර ළගට ගියා.

පඳුරු ඇත් කරලා බලද්දි , අනේ! පුංචි ගිරා පැටියෙක්.

ගිරා පැටියා හොඳටම බයවෙලා .

එයාට ඉගිලෙන්නත් බෑ.

“බය වෙන්න එපා.අපි ඔයාට  කරදර කරන්නේ නෑ.

අපි උදවු කරන්නම්” හා පැටියා කිවුවා.



CS CamScanner



ගිරා පැටියට හිතුණා, මේ දෙන්නා මට උදවු කරයි කියලා.
ගිරා පැටියා කඳුලු සල සල මෙහෙම කිව්වා.

“අනේ මං අද තමයි ඉගිලෙන්න ගත්තේ අම්මයි තාත්තයි

මට ඉගිලෙන්න එපා කියලා කෑම හොයන්න ගියා.”


“ඉතින් ඉතින් ඔයා වැටුණේ කොහොමද?” කූඹි පැටියා ඇහුවා. “එයාලා ගියාම මං තනියම එළියට ආවා. මං හිතුවේ මට තනියම ඉගිලෙන්න පුලුවන් කියලා .ඒත් මං වැටුණානේ මගේ කකුල හොඳටම රිදුණා. චූටි හොටත් වැදුණා.”

ගිරා පැටියා දුකෙන් කිව්වා.



“අම්මයි, තාත්තයි එපා කියපු දේ ඇයි කරේ? කමක් නැහැ දැන් එයාලා එනකම් අපිත් එක්ක ඉන්න” කූඹි පැටියා කිව්වා.

හා පැංචා කකුල අතගෑවා. එයාලාගේ කෑම බීම දුන්නා. කරනම් ගහලා පෙන්නුවා. කූඹි පැටියත් එයාගේ පිට උඩ කෑම තියාගෙන ගිරා පැටියාගේ වටේ ගියා.





ටික වෙලාවකින් මෙයාලා හොඳ යාලුවෝ වුණා. දැන් ගිරා පැටියාගේ කකුල රිදෙන්නෙත් නෑ.චූටි හොටත් හොඳ වෙලා.

හොඳටම ඉලිලෙන්න බැරි වුණත්

එයාත්   ටිකක් ඉගිලිලා පෙන්නුවා.

හවස් වෙද්දී ගිරා අම්මයි, තාත්තයි පළතුරුත් අරන් චූටි පැටියා ළඟට ආවා.ඒත් ගිරා පැටියා නැහැ.

අම්මයි තාත්යා බය වෙලා කෑ ගැහුවා.

“පැටියෝ ඔයා කොහේද?” කියලා.



ගහ යට හිටපු යාලුවෝ තුන් දෙනාට මේ සද්දේ ඇහුණා.අන්න ඔයාව හොයනවා. හා පැංචා කිව්වා. ගිරා පැටියත් හයියෙන් කෑ ගැහුවා. අම්මයි, තාත්තයි ළඟටම ආවා. ඒත් හා පැටියා දැකලා බයවෙලා ආයෙමත් අත්තක වැහුවා.



"අම්මේ,තාත්තේ,බය වෙන්න එපා මෙයාලා මගේ යාලුවෝ"

ගිරා පැටියා කූඹි පැටියට ළං වෙලා කිව්වා.

ටික වෙලාවක් බලා ඉඳලා ගිරා අම්මයි ,තාත්තයි පැටියා ළඟට ආවා. හා පැටියගෙනුත් , කූඹි පැටියාගෙනුත් කරදරයක් නැති බව තේරුණු අම්මයි,තාත්තයි ඔයා කොහොමද මෙතෙනට ආවේ කියලා ඇහුවා. ගිරා පැටියා එයාට උන දේ කිව්වා.



CamScanner



“අපි හැමදේම කරන්නේ අපේ දරුවෝ වෙනුවෙන්,

එයාලාට පුංචි කරදරයක්වත් වෙනවට අපි කැමති නෑ.

ඒක නිසා තමයි මේ දේ කරන්න ,මේ දේ කරන්න එපා

කියලා අපි කියලා දෙන්නේ.

දැක්කා නේද කියන දේ අහන්නනේ

නැතුව ඔයාට උන දේ.හොඳ යාලුවෝ දෙන්නනෙක්

හම්බ වුණ නිසා හොදයි”

අම්මා කිව්වා.

**අම්මයි, තාත්තයි යාලුවෝ දෙන්නට ස්තූතියි කරා.**

**“අපි ආයම හම්බවෙමු. “**

**කූඹි පැටියයි, හා පැටියයි දුකෙන් කිව්වා.**

**“තව ටික දවසකින් මට හොඳට පියාඹන්න පුලුවන් වෙයි.**

**මං හැමදාම ඔයාලා බලන්න එන්නම්. ඔයාලා නිසා මං බේරුණා. මම කවදාවත් ඔයාලා අමතක කරන්නේ නෑ. “**

**අපි හොඳ යාලුවෝ වෙමු.**



ගිරා පැටියා එහෙම කියලා

අම්මයි, තාත්තයි

එක්ක

ඈතට පියඹලා ගියා.

CS CamScanner

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප් නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ සාහිත්‍යය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාවය වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟම දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය සමඟ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩ නඟා දී තිබේ. තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනවිරත්න මහලේකම්